ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாட்டுத் திணைக்களம்
DOMESTIC OPERATIONS DEPARTMENT

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

මෙහෙයුම් උපදෙස් අංකः 35/03/016/007/002 2019 පෙබරවාරි 14

සියලුම සහභාගිත්ව ආයතන වෙත

# වෙළඳපොළ කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්

උක්ත කරුණ සම්බන්ධයෙන් 2016 ඔක්තෝබර් 26 දිනැති අපගේ චක්‍රලේඛ අංක 35/03/016/007/001 හා බැඳේ. 2019 පෙබරවාරි 14 දින සිට බලපැවැත්වෙන පරිදි, ඉහත සඳහන් මෙහෙයුම් උපදෙස්වල අඩංගු වගන්ති 17 (ආ) සහ 17 (ඇ) පහත පරිදි සංශෝධනය වේ.

**17.0 අලාභ ප්‍රතිපූර්ණය සහ ගෙවීම් පැහැර හැරීම සඳහා වන පොලී අයකිරීම**

17(ආ) සහභාගිත්ව ආයතනයක් විසින් ගනුදෙනුව කල්පිරෙන දිනයේදී එම ගනුදෙනුව පියවීම පැහැර හැරීම

යම්කිසි සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව කල්පිරෙන දිනයේදී (ආපසු ගෙවන දිනයේදී) ලංකාසෙක්‍යු පද්ධතියෙහි ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම, ආපසු විකුණුම් වටිනාකම ගෙවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් තම පියවීම් ගිණුමෙහි පවත්වා ගැනීමට අසමත් වුවහොත්, අදාළ ගනුදෙනුවෙහි පොලී ප්‍රමාණයට අමතරව හානි පූර්ණයක් ලෙස එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයෙන් එකකට (0.1%) සමාන වූ ගෙවීම් පැහැර හැරීමේ පොලියක් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට අදාළ සහභාගිත්ව ආයතනය බැඳී සිටී.

17(ඇ) ලිත් වර්ෂයක් තුල සහභාගිත්ව ආයතනයක් විසින් එක් වරකට වඩා ලංසුව/ගනුදෙනුව එකඟ වූ පරිදි සිදු නොකිරීම හෝ එම ගනුදෙනුව නිසි පරිදි පියවීම පැහැර හැරීම

සහභාගිත්ව ආයතනයක් ලිත් වර්ෂයක් තුළ ලංසුව/ගනුදෙනුව එක් වරකට වඩා එකඟ වූ පරිදි සිදු නොකළ විට, එම සහභාගිත්ව ආයතනයට, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එවැනි ගනුදෙනු කිරීමට ලබා දී ඇති පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කළ හැකිය. සහභාගිත්ව ආයතනයක් විසින් ලිත් වර්ෂයක් තුළ තුන් වරකට වඩා ගනුදෙනු නිසි පරිදි පියවීම පැහැර හැරීම සිදු කළ හොත්, ගෙවීම් පැහැර හැරීමේ පොලී අනුපාතිකය, එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයෙන් දෙකක් (0.2%) දක්වා ඉහළ නැංවීමට හෝ එකී සහභාගිත්ව ආයතනයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එවැනි ගනුදෙනු කිරීමට ලබා දී ඇති පහසුකම, මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කිරීමට කටයුතු කළ හැකිය.

අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

011-2477036 011-2346287 ddod@cbsl.lk www.cbsl.gov.lk